# සද්දනීති ව්‍යාකරණය පිළිබඳ හැඳින්වීමක්

**පහලගම ධම්මික හිමි**

## හැඳින්වීම

පවත්නා භාෂාවකට ව්‍යාකරණ රචනා කිරීමේ දී භාෂාවේ දක්නට ලැබෙන දුෂ්කර අංශයන්ට ප්‍රථමයෙන් ව්‍යාකරණ ඉදිරිපත් කිරීම සිදුවිය යුත්තකි. එම ලක්ෂණය උසස් ව්‍යාකරණයන් සතුවෙයි. කච්චායන හා මොග්ගල්ලායන යන උභය ව්‍යාකරණ සම්ප්‍රදායයන්හි ම දක්නට ලැබෙන්නේ සාම්ප්‍රදායික ක්‍රමයට ප්‍රථමයෙන් වර්ණ මාලාව නිර්දේශ කිරීමයි. *"අක්ඛරාපාදයො එකචත්තාලීසං"*[1] හා *"අ ආදයො තිතාලීසාවණ්ණා"* වශයෙන් අක්ෂර පිළිබඳ ඉගැන්වීම ප්‍රථම කොට ඉදිරිපත් කරන අයුරු දක්නට ලැබේ. භාෂාවක් ඉගෙන ගන්නා ආධුනිකයාට එහි සෑම පදයක් ම නාම පද සේ පෙනීයාමට පුළුවනි. ඊට හේතුව ව්‍යාවෘත වාග් මාලාවේ වැඩි ප්‍රමාණයක් නාම පද වීමයි. නමුත් ක්‍රියා පද තරමක් දුරට විග්‍රහ කර ගැනීම අපහසුය. ක්‍රියා පදයේ ලිංගය, වචන, කාලය, පුරුෂ, විභක්ති, ආදී විවිධ අංශ ඔස්සේ විවරණය කොට ගැනීමට අවශ්‍යවෙයි. එම නිසා සද්දනීති කර්තෘතුමා ප්‍රථමයෙන් ධාතු පිළිබඳ ඉගැන්වීම සිදුකරමින් ස්වකීය ව්‍යාකරණය ආරම්භ කළ බව සිතීමට පුළුවනි. කෙසේවෙතත් උසස් ව්‍යාකරණයක ලක්ෂණයක් වශයෙන් සද්දනීති අනුදත් ක්‍රමය හැඳින්විය හැකිය.



## පදමාලා කොටස

සද්දනීති ව්‍යාකරණය ආරම්භ කරන්නේ සවිකරණාඛ්‍යාත විභාග පරිච්ඡේදයෙනි. මෙම ප්‍රථම පරිච්ඡේදයේ සිට අත්ථන්තික විභාග නම් වූ දාහතර වන පරිච්ඡේදය දක්වා පද මාලාව පිළිබඳ උගන්වනු ලබයි. පරිච්ඡේද දාහතරක් ඒ සඳහා වැය කොට තිබේ. එහි දී ධාතු හා නාම යන පද දෙවර්ගය පිළිබඳ සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි. ප්‍රථම පරිච්ඡේද හතර ධාතු පිළිබඳවත් පස්වැනි පරිච්ඡේදයේ සිට දාහරවන පරිච්ඡේදය දක්වා නාම පද උගන්වයි. ධාතු පිළිබඳ හඳුන්වා දෙන්නේ මෙසේය, කවරාර්ථයෙන් ධාතු වන්නේ ද? ස්වකීය ස්ථානය දැරීම් අර්ථයෙන් හා අත්ථාතිශය සංයෝගය පරාර්ථ වශයෙන් දරන හෙයින් ධාතු වන බව මෙයින් දැක්වේ.[2] ඉන් අනතුරුව නාම පිළිබඳ හඳුන්වා දෙයි. නාම නාම, කිතක නාම, සමාස නාම හා තද්ධිත නාම වශයෙන් සතරාකාර වන බවත් නාම ප්‍රත්‍ය හා ආඛ්‍යාත ප්‍රත්‍ය වශයෙන් දෙවැදෑරුම් වන බව දක්වයි. ක්‍රියා පදයේ ලක්ෂණ කථනය කරනු ලබන්නේ මෙසේය,

*"ඉමමත්ථංහි සන්ධාය වුත්තමාචරියන්හි,*
*මහාවෙය්‍යාකරණෙහි නිරුත්තිනය දස්සිහි*

*යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචී තිකාරකං,*
*අත්තිලිංගං ද්විවචනං තදාඛ්‍යාතන්ති වුච්චති"*[3]

යන සදූපදේශනය උද්ධරණය කරමින් එකී ආඛ්‍යාත ලක්ෂණ සවිස්තර කථනයක යෙදෙයි. දෙවැනි පරිච්ඡේදය ආරම්භ කරන්නේ මෙසේය, *"ඉති පරං පවක්කාමි සොතූනං මතිවඩ්ඪනං ක්‍රියාපදක්කමං නාමවිභක්ත්‍යාදීනං දීපයං"* ක්‍රියා පද වරනගන්නා වූ ක්‍රියා විභක්ති ඉන් අනතුරුව දක්වා තිබේ.

1. වත්තමාන
2. පංචමී
3. සත්තමී
4. පරොක්ඛා

5. හීයත්තනී
6. අජ්ජතනි
7. භවිස්සන්ති
8. කලාතිපත්ති

යන විභක්තීන්ට අදාළ ආඛ්‍යාත ප්‍රත්‍ය නිර්දේශ කරමින් උදාහරණ ගෙන හැර දක්වයි. ආඛ්‍යාත විභක්ති අට යෙදෙන කාල දක්වන්නේ ඉන් අනතුරුවයි. ඒ ඒ ආඛ්‍යාත විභක්ති භාවිත කළ හැකි මර්යාදාවන් ඉන් ප්‍රකාශිතය.

වර්තමාන කාලය ප්‍රකාශ කිරීමේ දී වත්තමාන විභක්තියත්, ආශිර්වාදකථනයේ දී පංචමී ද වර්තමානයෙහි අනුමති, පරිකල්පන, ප්‍රාර්ථනා, විධි, ප්‍රශ්නාර්ථ හා නිමන්ත්‍රණාර්ථයෙහි සත්තමී ද ඇසට හසු නොවූ අතීතය පරොක්ඛා ද ඊයේ පටන් දත් නොදත් අතීතය හීයත්තනී ද පෙර සිට වත්මන දක්වා අජ්ජතනි ද යම්කිසි හේතුවකින් ක්‍රියාවක් වැලැක්වේ ද එය කාලාපත්ති හා අනාගත සිදුවන්නා වූ දේ භවිස්සන්ති විභක්තියෙන් ද තබනු ලබයි.[4] ආඛ්‍යාත විභක්තිවල ක්‍රියා මූලයන් යොදන ආකාරය මෙහි දී විශේෂ වශයෙන් උගන්වයි. හතර වන පරිච්ඡේදයේ දී ප්‍රකීර්ණක (සංග්‍රහ) විනිශ්චය කරන බව දක්වමින් පරිච්ඡේද ආරම්භ කරයි. අත්ථුධාර, අත්ථසද්දචින්ති, අත්ථාතිසයයෝග, සමානාසමානවසේන වචනසංගහෝ, ආගමන ලක්ඛණවසේන විභක්ති වචන සංගහෝ, කාලවසේන විභක්ති සංගහෝ, කාල සංගහෝ, පකරණ සංසන්දනා, වත්තමාදීනං වචනත්ථවිභාවනා යන කරුණු නමය පිළිබඳ විස්තර කරයි. මෙම පරිච්ඡේද හතරම වැය කරන්නේ ධාතු පද මාලාව විස්තර කිරීම සඳහාය.

නාම පද මාලාව පිළිබඳ සද්දනීති ව්‍යාකරණයේ පස්වැනි පරිච්ඡේදයේ සිට දහනව වන පරිච්ඡේදය අවසානය දක්වා දීර්ඝ විස්තරයක් ඉදිරිපත් කරනු ලබයි. පස්වැනි පරිච්ඡේදය ආරම්භ කරන්නේ මහාකච්චායන හිමියන් කළ නිරුත්ති පිටකය හා යමක හිමියන් කළ චූලනිරුත්තියේ දැක්වෙන නාම පිළිබඳ



සඳහන සනිටුහන් කරමින්ය. නාම පදය ලිංග, වචන හා විභක්ති වශයෙන් විභේදනය දක්වයි. ප්‍රථමයෙන් විභක්තීන්ට අදාළ විභක්ති ප්‍රත්‍ය යෙදෙන ආකාරය උගන්වයි. ආලපන විභක්තියේ දී ඒකවචන හා බහුවචනය සඳහා යෙදෙන ආමන්ත්‍රණාර්ථ පදය ලෙස භො හා භවන්තො යනුවෙන් යෙදෙන බව *(භො පුරිස භවන්තො පුරිසාති ඉමෙහි වචනෙහි'පි දූරට්ඨානේ ච අදූරට්ඨානේ ච ආයතනෙන සරේන ආමන්තණමේව පමාණං දීඝරස්සමත්තා විසෙසො තස්මා භො සත්ථ, භො රාජ, භො ගච්ඡ, භො මුනි)* දක්වයි. අකාරාන්ත පුරුෂ ලිංග ශබ්ද දැක්වීමෙන් අනතුරුව මනෝගණික ශබ්ද උගන්වනු ලබයි. එම ගණයේ ශබ්ද දාසයක් පෙන්වා දෙයි.

පස්වෙනි පරිච්ඡේදය ආරම්භ කරන්නේ *(අථ පුබ්බාචරිය මතං පුරේචරං කත්වා ආකාරාන්තපුල්ලිංගානං පකති රූපේසු අභිභවිතුං ඉච්චේතස්ස පකතිරූපස්ස නාමිකපදමාලං වක්කාමි)* ආකාරාන්ත පුල්ලිංග නාම පද ඉදිරිපත් කරන බව දක්වමින්ය. නාමශේෂ ව්‍යාකරණ ග්‍රන්ථයන්ගේ පාඨාන්තරෝද්ධරණය කරයි. සත්ථු (ශාස්තෘ) ශබ්දයේ පඨමා විභක්ති ඒකවචනයේ සත්ථුනා රූපය පිළිබඳ යම් ගැටලුවක් පෙන්වා දෙයි. චූලනිරුත්ත ව්‍යාකරණය හා කච්චායන ව්‍යාකරණය අනුදත් මාර්ගය වන්නේ "සත්ථුනා" යන්නයි. නමුත් මෙහි දී එකී නාම පද රූපය තතියා ඒකවචන රූපය ලෙස යෝජනා කරයි.

හත්වැනි පරිච්ඡේදයේ දී ගච්ඡන්ත ආදී ශබ්ද පිළිබඳ උගන්වයි. මෙහි දී ගච්ඡන්ත ශබ්දය නිග්ගහීතාන්ත පුල්ලිංග ශබ්දයක් වශයෙන් හඳුන්වා දෙන අතර කච්චායන සම්ප්‍රදායයගෙයන් බැහැර වී ඇති බව පෙනෙයි. එය කච්චායන හා සද්දනීති ව්‍යාකරණයේ දී ගච්ඡන්ත ශබ්දය වරනගන ආකාර සංසන්දනාත්මකව බැලිය යුතුය. ඒ අනුව,

### ගච්ඡන්ත ශබ්දය කච්චායන සම්ප්‍රදාය

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගච්ඡං | ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| ආලපන | (භවං) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා | (භවන්තානි) ගච්ඡන්තා, ගච්ඡන්තානි |
| දුතියා | ගච්ඡන්තං | ගච්ඡන්තේ, ගච්ඡන්තානි |
| තතියා | ගච්ඡතා, ගච්ඡන්තේන | ගච්ඡන්තේහි, ගච්ඡන්තේහි |
| කරණ | ගච්ඡතා, ගච්ඡන්තේන | ගච්ඡන්තේහි, ගච්ඡන්තේහි |
| චතුත්ථී | ගච්ඡන්තෝ, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තිනං |
| පඤ්චමී | ගච්ඡතො, ගච්ඡන්තස්ස, ගච්ඡතම්හා, ගච්ඡන්තස්මා | ගච්ඡන්තේහි, ගච්ඡන්තේහි |
| ඡට්ඨී | ගච්ඡතෝ, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| සත්තමී | ගච්ඡතෝ, ගච්ඡන්තස්ස, ගච්ඡති, ගච්ඡන්තේ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං | ගච්ඡන්තේසු |

### ගච්ඡන්ත ශබ්දය සද්දනීති සම්ප්‍රදාය

| විභක්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | ගච්ඡන්තෝ | ගච්ඡන්තෝ, ගච්ඡන්තා |
| දුතියා | ගච්ඡන්තං | ගච්ඡන්තේ |
| තතියා | ගච්චන්තා | ගච්ඡන්තේහි, ගච්ඡන්තේහි |
| චතුත්ථී | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| පඤ්චමී | ගච්ඡතා | ගච්ඡන්තේහි, ගච්ඡන්තේහි |
| ඡට්ඨී | ගච්ඡතො, ගච්ඡන්තස්ස | ගච්ඡතං, ගච්ඡන්තානං |
| සත්තමී | ගච්ඡති, ගච්ඡන්තේ | ගච්ඡන්තේසු |
| ආලපන | (හො) ගච්ඡ, ගච්ඡා | (භවන්තෝ) ගච්චන්තෝ, ගච්ඡන්තා, |

යමක තෙරුන් චූලනිරුත්තියේ දී තතියා ඒකවචනය ගච්ඡන්තේන, ගච්ඡන්තා ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා,



ගච්ඡන්තස්මි යන රූප දක්නට නොමැති බව අග්ගවංස පාදයෝ ප්‍රකාශ කරති. කච්චායන ව්‍යාකරණයේ ශබ්ද නාමයක් වශයෙන් අප්‍රකට අරහන්ත ශබ්දය පිළිබඳ විස්තර දක්වයි. අරහන්ත ශබ්දය ගුණ ශබ්දයක් හෙයින් අවිසේසයෙන් අරහා, අරහන්තෝ, අරහන්තා යන රූපවල යෙදෙන බව මෙසේ දක්වයි. *(ඉති ච ඒතං හි සමන්තපාසාදිකායං මනුස්සවිග්ගහට්ඨානේ දිස්සති, උත්තරිමනුස්ස ධම්මපාලියං පන මයඤ්චමතා අරහන්තෝති පදං දිස්සති)* එසේ ම අරහ ශබ්දය ස්ත්‍රී ලිංග නපුසක ලිංග වශයෙන් බෙදීමක් ප්‍රකට නොවන බව වශයෙන් *(ඉධ ඉත්ථිනපුංසකලිංග වසේන විසුතං වත්තබ්බනයෝ අප්පසිද්ධෝ)* දක්වයි. මෙම පරිච්ඡේදයේ දී ඉකාරාන්ත පුල්ලිංග ශබ්ද දක්වා විස්තර කරයි.

හත්වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ *(ඉදානි භාවී ඉච්චේතස්ස පකතිරූපස්ස අඤ්ඤේසඤ්ච තංසදිසානං නාමිකපදමාලා විභාගං වක්ඛාම පුබ්බාචරියමතං පුරේචරං කත්වා)* වශයෙන් දණ්ඩී හා භාවී යන ශබ්දයන් සේ ම වරනැගෙන ශබ්ද පනස් තුනක් පෙන්වා දෙයි. ඉන් අනතුරුව ඊකාරාන්ත පුල්ලිංග, උකාරාන්ත පුල්ලිංග, ඌකාරාන්ත පුල්ලිංග වශයෙන් නාම වරනැගීමේ ලක්ෂණ මෙන් ම ස්ථානයේ දී පද යෝජනා කරයි. අට වන පරිච්ඡේදයේ දී ස්ත්‍රී ලිංග නාම පද වරනැගීම උගන්වයි. එහි දී කඤ්ඤා, භවිතා, මාතා, ධීතා, යන ශබ්ද අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත හා ඔකාරාන්ත වශයෙන් වරනගයි. නමවන පරිච්ඡේදය ආරම්භ කරන්නේ නිග්ගහීත නපුංසක ලිංග චිත්ත ශබ්දය වරනැගීමෙනි. භූත, කම්ම, ගුණව, කරොන්ත, ගච්ඡන්ත, දක්වමින් නපුංසක ශබ්ද වරනැගීමේ ක්‍රමය විස්තර කරයි.

දහවැනි පරිච්ඡේදය ආරම්භකරන්නේ *(අයං ලිංගත්තයමිස්සකෝ නාමිකපදමාලා උද්දේසේ තත්‍ර)* යනුවෙන් ලිංගත්‍රයෙහි මිශ්‍ර ශබ්ද උගන්වනු ලබයි. ප්‍රථමයෙන් ම ඉත්ථී ලිංග ශබ්ද දක්වන අතර එකොළොස් වන පරිච්ඡේදයේ දී ගුණ නාම පිළිබඳ උගන්වයි. සර්ව නාම පිළිබඳ උගන්වන්නේ දොළොස් වන පරිච්ඡේදයේය. එය,

"සබ්බසාධාරණතානි නාමානිච්චේව අත්ථතො,
සබ්බනාමාති වුච්චන්ති සත්තවීසති සංඛතො"[5]

සර්වසාධාරණ නාම වශයෙන් දක්වන අතර සංඛ්‍යාත්මකව ප්‍රකෘති විසිහතක් පෙන්වාදෙයි. ඒ අනුව, "සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, අධර, ය, ත, එත, ඉම, අමු, කිං, එක, උභ, ද්වි, ති, චතු, තුම්හ. අම්හ"[6] විටෙක සද්දනීති කර්තෘ නාමශේෂ පාලි ව්‍යාකරණය තුළ දක්නට ලැබෙන්නේ පච්චත්ත, උපයෝග, භුම්ම, කරණ යන විභක්ති එකී අර්ථයෙන් ම භාවිත කරයි. දහතුන් වන පරිච්ඡේදයේ දී සංඛ්‍යානාම උගන්වයි. එක, දෙක, තුන හා හතර ආදි සංඛ්‍යානාම පිළිබඳ මෙසේ දක්වයි. "යාහි සා හෙට්ඨා අම්හේහි එක ද්වි ති චතු ඉච්චේතේසං සංඛ්‍යා සබ්බනාමානං නාමිකපදමාලා කථිතා"[7] සංඛ්‍යා සර්වනාම මෙහි දී උගන්වනු ලබයි. අකම්මක, සකම්මක හා සුද්ධකත්තරි වශයෙන් ඉදිරිපත් කරයි. එසේ ම (ත්වායන්තපදානි වුච්චතේ) යනුවෙන් පූර්ව ක්‍රියා දක්වයි. අත්ථන්තික නම් දාහතර වැනි පරිච්ඡේදය දක්වා පද මාලා කොටසට අයත් වූ ව්‍යාකරණ විධීන් උගන්වයි. මෙහි දී නාම පිළිබඳ සවිස්තර කථනයක් ඉදිරිපත් කරන අතර සමහර පරිච්ඡෙද නාම වරනැගිල්ලක ස්වරූපයක් ඉස්මතුව පෙනේ. නමුත් සද්දනීති ව්‍යාකරණ කර්තෘවරයා අන්‍යමතයන් පෙන්වා දෙමින් ස්ව මතය ස්ථාපනය කරනු ලබයි. මෙම කොටස පදමාලා නමින් හඳුන්වයි.

ධාතුමාලා කොටස

ධාතුමාලා කොටස පරිච්ඡේද පහක අන්තර්ගත වෙයි. එනම් නාම ධාතු විභාග පරිච්ඡේදයේ සිට දහනම වන සබ්බගුණ විනිච්ඡය නම් පරිච්ඡේදය දක්වා ධාතුමාලාව උගන්වයි. ප්‍රථමයෙන් ම "ඉ" ධාතුව දක්වයි. (ඉ ගතියං යෙසං ධාතුනං ගති අත්ථො, පවත්ති පාපුණාති'පි. තත්‍ර ගමනං දුවිධං කායගමනං ඤාණගමනඤ්ච, තෙසු කායගමනං නාම ඉරියාපථ ගමනං ඤාණගමනං නාම ඤාණුප්පත්ති, තස්මා පයොගානුරූපේන ගච්ඡතී'ති. පදස්ස ජානාතී'ති'පි අත්ථො භවති. පවත්තතී'ති'පි



අත්ථො භවති. පාපුණාතී'පි 'පි අත්ථො භවති,..... ධාතුනං යථාපයොගං අත්ථො ගහෙතබ්බො. තස්සිමාන රූපානි භවන්ති. ඉති, එති, උදෙති) වශයෙන් ධාතු මූලයන් හා ප්‍රත්‍ය එක්වීමෙන් සෑදෙන්නා වූ ආඛ්‍යාත පද මෙහි උගන්වයි. කච්චායන ව්‍යාකරණයේ දී "ඉ අජ්ඣානෙ, ගතිම්හි"[8] *(to study, to go)* දුරීමෙහි හා යාමෙහි "උපෙති"[9] ඉ ධාතුව ගමනාර්ථයෙන් දෙවැදෑරුම් වෙයි. සාමාන්‍ය පියවි ගමන හා ඤාණමය වූ ගමන වශයෙනි. ඉ ධාතුව පිළිබඳ දීර්ඝ විස්තරයක් උදාහරණ සහිතව විස්තර කරනු ලබයි. ඉන් අනතුරුව ධාතු පෙළ ගස්වා තිබෙන්නේ, ක, ඛ, ග, ඝ, ච, ඡ, ජ, ඣ, ඤ, ට, ඨ, ඩ, ඪ, ණ, ත, ථ, ද, ධ, න, ප, ඵ, බ, භ, ය, ර, ල, ව, ස, හ, ළ යන අක්ෂරාන්ත වන පරිදිය. පක්ක ධාතුව ඉදිරිපත් කරයි. (පක්ක, නීච ගතියං) හීන ගමන් ප්‍රකාශනයේ දී පක්ක ධාතුව භාවිත කරයි. මෙම ධාතුව කච්චායනයේ දී දක්නට නොමැති වීම විශේෂත්වයකි. දහ අට වන පරිච්ඡේදය දක්වා ධාතු මාලාව දක්වන අතර ධාතුමඤ්ජුසාවක විහිත කාර්ය පෙන්නුම් කරයි. දහනම වන පර්ච්ඡේදය ආරම්භ කරන්නේ,

"ඉතොපරං පවක්ඛාමි සබ්බගණනවිනිච්ඡයං,
සොතූනං පටුභාවත්ථං පරමේ පිටකත්තයේ.

පච්චයාදිවිභාවෙති නයේහි විවිධෙහි තං,
සුඛග්ගහාය සොතූනං සුණාථ මම භාසතො"[10]

යනුවෙන් ධාතු ගණ ඉදිරිපත් කරයි. බුද්ධ භාෂිතයෙහි ධාතු ගණ අටක් හා විකරණ සොයා ගැනීමට පුළුවන් බව පෙන්වා දෙයි. (ඉමසුම්ං භගවතො පාවචනෙ අට්ඨවිධා ධාතුගණ භවන්ති ඒ තෙසු විකරණප්පච්චයවසෙන) ධාතුගණ වශයෙන් පෙන්වා දෙන්නේ,

1. භූවාදිගණ
2. රුධාදිගණ
3. දිවාදිගණ
4. ස්වාදිගණ

5. කියාදිගණ
6. ගහාදිගණ
7. තනාදිගණ
8. චුරාදිගණ

ගණ අටයි. ධාතු ගණ අට දක්වීමෙන් අනතුරුව ඊට අදාළ විකරණ දක්වනු ලබයි. ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරෙහි විකරණ නමින් හැඳින්වෙන ප්‍රත්‍ය සමූහයක් යෙදෙයි.[11]

ධාතු ගණවලට පිළිවලින් අ, ං පූර්ව අ, ය, ණු-උණා-ණා, නා, ඕ-යිර, ණෙ-ණය, යන විකරණයන් උගන්වනු ලබයි. දහ අටවන පරිච්ඡේදය හා දහනම වන පරිච්ඡේදයේ දී ධාතු ගණ උදාහරණ මගින් විවිධ කොටස් දක්වමින් උගන්වනු ලබයි.

## සුත්තමාලා කොටස

සාම්ප්‍රදායික ව්‍යාකරණ ග්‍රන්ථවල මෙන් ම ව්‍යාකරණ විධීන් උගන්වන විසිවන සන්ධිකප්පනාම පරිච්ඡේදයේ සිට විසි අටවන පාලිනයාදි සංගහො පරිච්ඡේදය දක්වා කොටස සුත්තමාලා නමින් හඳුන්වයි. මෙම පරිච්ඡේදය ආරම්භ කරන්නේ නමස්කාරයකින් ආරම්භකරන හෙයින් මහාසද්දනීතිප්පකරණයේ ද්වීතීය කොට්ඨාශය වශයෙන් සමහර උගතුන් හඳුන්වයි. විසිවන පරිච්ඡේදය ආරම්භ කරන්නේ *(ඉතො පරං පවක්ඛාමි උද්දෙසානුක්කමේන සලක්ඛණො සන්ධි නාමාදි භේදො භවිස්සති. එත්ථච'ලක්ඛණ'න්ති සුත්තං වුච්චති සුත්තස්සහි අනේකානි නාමානි සුත්ත, ලක්ඛණ, වචනං, යොගා, ආරම්භො, සත්ථ, වාක්‍යායත්න'න්ති)* වශයෙන් පූර්වයේ ප්‍රකාශිත ආකාරයට ලක්ෂණ සහිතව සන්ධි නාම භේද වන්නේය. එහි ලක්ෂණ සූත්‍ර මාර්ගයෙන් ප්‍රකාශ කරන අතර සූත්‍රයන්ගේ නොයෙක් සූත්‍ර, ලක්ෂණ, වචන, යෝග, ආරම්භ, ශාස්ත්‍ර, වාක්‍යන්ත කොට ප්‍රකාශ වෙයි. මෙහි දී සන්ධි යන්න ප්‍රායෝගිකව තේරුම් ගැනීමට අවැසි ආකාරයට අග්ගවංසපාදයෝ උපමා සහිතව පැහැදිලි කරයි. ඒ අනුව,



සන්ධි නාම් කාර්යය සියලු ව්‍යඤ්ජනයන්හි ලුණු ධූමය මෙන් ද රාජකෘත්‍යයෙහි සියල්ල සිඳු කරන ඇමතියන් මෙන් ද සන්ධි නාම් කාර්යය සියලු දේහි ප්‍රමුඛතම කාර්යය බව ප්‍රකාශ කරති.[12] ප්‍රථමයෙන් ම *(තස්මා සන්ධිනාමකාරකසමාසාදිප්පභේසු සන්ධිප්පභේදං පකාසිස්සමි. එවං තං පකාසෙන්තෝවා'හං පඨමතරං වණ්ණත්තමුපගතස්ස සද්දස්සු'ප්පත්තිංයය්'ච සඤ්ඤවිධානාදීහි සද්ධිං පකාසෙස්සාමි)* සන්ධි නාම කාරක සමාසාදියෙන් සන්ධි පිළිබඳ ප්‍රථමයෙන් ප්‍රකාශ කරන බවත් එසේ ප්‍රකාශ කරමින් වර්ණ පිලිබද සංඥා විධාන ප්‍රකාශ කරමින් සුත්තමාලා කොටස ආරම්භ කරයි. වර්ණයන්ගේ උප්පත්තිය උරසි (ළය) කණ්ඨ (උගුර) සිරසි (මුදුන) යන ස්ථානත්‍රයෙන් උපදින බවත් විශේෂයෙන් පමණක් බුදුරදුන් කල්පසිය දහසකට අධික අසංක සතරක් දානසීලා දී පාරමිතා සුපූරණය කළ පිනෙන් අතිපාරිශුද්ධ වූ නාභියේ පටන් හටගත් මහාබ්‍රහ්ම ස්වරය මෙන් පිත් සෙම්වලින් පළිබද්ද නොවී පිරිසිදු අෂ්ටාංගයෙන් ශබ්ද උත්පාදය කරති. බුද්ධ විෂයට පමණක් සුවිශේෂ වූ ශබ්දෝත්පත්ති අෂ්ටාංගය නම්,

*"විස්සට්ඨමඤ්ජුවිඤ්ඤෙය්‍යා සවනීයා'විසාරිනො,*
*බින්දු ගම්භීරනින්නාදිත්ථේවමට්ඨංගිකො සරා"*[13]

යන අංග බුදුරදුන්ගේ ස්වරයේ පවත්නා බව පෙළ සාහිත්‍යයේ හමුවෙයි. චිත්තජ ශබ්දයන් කණ්ඨ, තාලු, මුද්ධ, දන්ත, ඔට්ඨ, යන ස්ථාන පහ තුළ ශබ්ද ගැටීමෙන් වණ්ණ බවට පත්වෙයි. වර්ණෝත්පත්තිය දක්වා සූත්‍ර වෘත්ති හා අවුත්ති දක්වන බව *(ඉමස්මිං සද්දනීතිප්පකරණෙ සුත්තානි සවුත්තකානි ච අවුත්තිකා ච කත්වා වදාම)* ප්‍රකාශ කරයි.

සද්දනීති ව්‍යාකරණයේ වර්ණ නිර්දේශ සිදුකරන්නේ මෙසේය. *"අප්පභූතෙතෙ'කාතාලීසසද්දා වණ්ණා"* යනුවෙන් වර්ණ හතලිස් එකක් (41) පාලි භාෂාව සඳහා නිර්දේශ කරයි. සඤ්ඤාවිධාන කොටසේ දී සූත්‍ර 21 මුල් කොටගෙන වර්ණමාලාවේ කොටස් පෙන්වාදෙයි. තිස්වන සූත්‍රයේ සිට සන්ධි කාණ්ඩය ආරම්භ කරයි. එහි දී

සන්ධි යනු පද හා අක්ෂර එකතු කිරීමයි. අතරක් නොදක්වා පදයන් සන්ධි කිරීමයි. ස්වරාක්ෂර එකතු කිරීම ස්වර සන්ධි නම් වෙයි. එහි දී ස්වරාක්ෂර ආදේශ හා ලෝපය ආදී සන්ධි කාර්යයන්ගෙන් පද එකතු කිරීම ස්වර සන්ධි නමින් හඳුන්වයි.[14] (සරා සරෙ ලොපං - කච්චායන ව්‍යාකරණ 12 සූත්‍රය) හා (සරො ලොපො සරෙ - මොග්ගල්ලායන ව්‍යාකරණ 1 සූත්‍රය) මෙන් ම සද්දනීති ව්‍යාකරණයේ දී ස්වර අක්ෂර එකතු කිරීම පිළිබඳ ප්‍රථම සූත්‍රය ලෙස (සරා ලොපං පප්පොන්ති සරෙ) යනුවෙන් සරසන්ධි සූත්‍රය දක්වයි. දීර්ඝ ස්වර පරකල්හි අ ස්වරයේ පටන් පිළිවෙලින් ඖ ස්වරය ලෝපය දක්වා උදාහරණ සහිතව විස්තර කරයි. සූත්‍ර 61 ස්වර සන්ධි කොටස සඳහා භාවිත කොට තිබේ. ව්‍යඤ්ජන සන්ධි ආරම්භ කරන්නේ 64 වන (සරා බ්‍යඤ්ජනෙ දීඝං) සූත්‍රයෙන්ය. ඉන් අනතුරුව වෝමිස්සක සන්ධි ඉදිරිපත් කරයි.

ස්වර, ව්‍යඤ්ජන හා නිග්ගහීත යන සන්ධිත්‍රයේ ම කාර්යන් සිදුවන හෙයින් වෝමිස්සක සන්ධි නම් වෙයි.[15] සාධාරණ සන්ධි හා වුත්තසන්ධි මෙම වෝමිස්සක සන්ධිය හඳුන්වන පර්යාය නම් වශයෙන් පෙන්වා දෙයි. 134 සූත්‍රයේ සිට 191 සූත්‍රය දක්වා මෙම සන්ධිය විස්තර කරයි. ඉන් අනතුරුව ලිංග පිළිබඳ උගන්වයි. *(විසදභාව'දිසහිතං ලීනස්ස'ත්ථස්ස ගමකං නිප්ඵන්න වචනං ලිංග නාම භවති)* යනුවෙන් ලිංග තුනක් පෙන්වා දෙයි.

1. විසද පුරුෂ ලිංග
2. අවිසද ස්ත්‍රී ලිංග
3. නේව අවිසද න අවිසද නපුංසක ලිංග

වශයෙන් ලිංග භේදය සළුදාහරණව උගන්වමින් නාම විභත්ති ප්‍රත්‍ය නර්දේශ කරයි. 192 සූත්‍රයේ සිට 546 සූත්‍රය දක්වා නාම උගන්වයි. ඉන් අනතුරුව කත්තු, කම්ම, කරණ, සම්ප්‍රදාන, අපාදාන හා ඕකාස යන ඡකාරක උගන්වමින් විසිවන පරිච්ඡේදය නිමා කරයි. විසිඑක්වන පරිච්ඡේදය ආරම්භ කරමින් සමාස පිළිබඳ 675 සූත්‍රයේ සිට 750 සූත්‍ර දක්වා උගන්වනු ලබයි. මෙම විසිඑක්වන පරිච්ඡේදය අවසන් කරන්නේ,



*"සද්දනීතිප්පකරණෙ කාරක විභාගෝ නාම එකවීසතිමෝ පරිච්ඡේදෝ"*[16]

සද්දනීතිප්‍රකරණයේ කාරක විභාගය නම් විසිඑක්වන පරිච්ඡේදය අවසන්වන බව දක්වමින්ය. ඉන් අනතුරුව අවසන් කළ යුතු පරිච්ඡේදය වන්නේ විසිදෙවන පරිච්ඡේදයයි. නමුත් 1909 අරුක්ගොඩ සීලානන්ද හිමි සංස්කරණ (පාලි) මහාසද්දනීතිප්පකරණයේ විසිදෙවන පරිච්ඡේදය අවසන් කිරීමක් සටහන් නොවේ. එය ග්‍රන්ථයේ පරිච්ඡේද විභජනයේ දෝෂයක් වශයෙන් පෙන්වා දීමට පුළුවනි. ඉන් අනතුරුව විසිතුන්වන පරිච්ඡේදය අවසන් කරයි.

*"තෙවීසතිමෝ පරිච්ඡේදෝ සද්දනීතියා සමාසප්පකරණං නිට්ඨිතං"*[17]

විසිහතර වන පරිච්ඡේදයේ තද්ධිත පිළිබඳ උගන්වනු ලබයි. 751 වන සූත්‍රයේ සිට 864 වන සූත්‍රය දක්වා තද්ධිත අන්තර්ගත වෙයි. විසිපස් වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ *"තත්ථ ක්‍රියං අක්ඛායතී'ති ආඛ්‍යාතං"*[18] ක්‍රියාර්ථය ප්‍රකාශ කරන්නේ ආඛ්‍යාත වශයෙනි. 865 වන පුබ්බානි විභත්තීනං ඡ පරස්සපදානි යන සූත්‍රයෙන් වර්තමාන කාල පරස්ස පදයට අදාළ ධාතු ප්‍රත්‍ය උගන්වයි.[19] ප්‍රථමා මධ්‍යම උත්තම යන පුරුෂත්‍රයට අයත් ධාතු ප්‍රත්‍ය වෙන් වෙන් ව නිර්දේශ කොට තිබේ. 1105 වන සූත්‍රය ආඛ්‍යාත විස්තර කරමින් විසිපස්වන පරිච්ඡේදය අවසන් කරයි. විසිහය වන පරිච්ඡේදය 1106 වන සූත්‍රයෙන් ආරම්භ කොට 1347 වන සූත්‍රයෙන් අවසන් කරයි. එහි දී කෘදන්ත පිළිබඳ උගන්වයි. විසිහත් වන පරිච්ඡේදය ආරම්භ කරන්නේ මෙසේය,

නාම, ආඛ්‍යාත, උපසග්ග හා නිපාත පද පිළිබඳ මෙම පරිච්ඡේදයේ දී උගන්වනු ලබයි.[20] නාමය පිළිබඳ හා නාමයේ විවිධ කොටස් විස්තර කරයි. ද්විධ, ත්‍රිවිධ, චතුර්විධ, ඡබ්බිධ හා ෂඩ්විධ වශයෙන් නාමයන්ගේ කොටස් දක්වයි. ආඛ්‍යාත පද විභත්ති අනුව දක්වයි. උපසග්ග පද විස්සක් දක්වන අතර එකී උපසර්ග විහිතාර්ථය ද දක්වයි. නිපාත පද රාශියක් යෙදෙන අර්ථයන් සමග දක්වයි. අවසාන පරිච්ඡේදය වන විසි අටවන

පරිච්ඡේදයේ දී උගන්වනු ලබන්නේ පෙළ, අට්ඨකථා, ටීකා හා ප්‍රකරණවල නය ක්‍රමයයි. අක්ඛර පද බ්‍යඤ්ජන ආකාර නිරුත්ති නිද්දේස යන බ්‍යඤ්ජන පද හය හා සංකාසන පකාසන විවරණ විභජන උත්තානීකරණ පඤ්ඤත්ති යන අත්ථපද හය පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරයි. අවසාන පරිච්ඡේදය සද්දනීතියට පරිශිෂ්ටයක් හා සමාන වන සේ රචනා කොට තිබේ. සුත්තමාලා කොටස තුළ සූත්‍ර පමණක් නොව ඊට අදාළ ව්‍යාකරණ සංග්‍රහ කොට තිබේ.

ලක්දිව රචනා නොවූවත් මෙම සද්දනීති ව්‍යාකරණය අංගසම්පූර්ණ ව්‍යාකරණයක් වශයෙන් සඳහන් කළ හැකිය. මෙහි උපයුක්ත ව්‍යාකරණ ක්‍රමවේදය බෙහෙවින් කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායයට සමීපස්ථ වෙයි. ව්‍යාකරණ ඉගැන්වීම සරළ ක්‍රමයේ සිට ආරම්භ කොට තිබේ. ඉගැන්වීමේ ක්‍රමත් සිත් ගන්නා සුළුය. පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයෙහි උසස් කෘතියක් වශයෙන් සද්දනීති ව්‍යාකරණය හැඳින්විය හැකිය.

## ආන්තික සටහන්

1. කච්චායන ව්‍යාකරණය, සංස්: වැගම පියරතන හිමි, එස්. ගොඩගේ ප්‍රකාශන, මරදාන. 1995, පි. 01. ''තෙ ච ඛො අක්ඛරාපි අකාරාදයො එකචත්තාළීසං සුත්තන්තෙසු සොපකාරං තං යථා - අ ආ ඉ ඊ උ ඌ එ ඔ ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං ඉති අක්ඛරා නාම හොන්ති'' කච්චායනසුත්තනිද්දෙසය, සංස්: මාබෝපිටියේ මෙධංකර හිමි, කොළඹ. 1915. පි. 04
2. මහාසද්දනීතිප්පකරණ, සංස්: අරුග්ගොඩ සීලානන්ද හිමි, 1909. පි. 02. තත්ථ ධාතූති, කේනට්ඨේන ධාතු? සකත්ථම්පි ධාරේති, ධාතු අත්ථාතිසයයෝගතෝ පරත්ථම්පි ධාරේති. (පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන් අතරින් විශාලතම පාලි ව්‍යාකරණය වන්නේ සද්දනීති ව්‍යාකරණ සම්ප්‍රදායයි. මෙය ලක්දිව රචිත කෘතියක් නොවෙයි. බුරුමයේ රචනා කොට ලංකාවට ගෙනවිත් තිබේ. මෙහි කර්තෘවරයා වන්නේ බුරුමයේ අරිමද්දන නුවර වාසය කළ අග්ගමහා පණ්ඩිත අග්ගවංස නම් තෙර කෙනෙකු බව ග්‍රන්ථාවසානයේ දැක්වේ. ''ඉති සමන්තභද්දස්ස මහාඅග්ගපණ්ඩිතස්ස සන්තිකෙ ගහිතූපජ්ඣෙන තංසිස්සස්ස සමන්තභද්දස්ස අග්ගපණ්ඩිතස්ස භාගිනෙය්‍යන පටිලද්දනාමධෙය්‍යන සුසම්පදායෙනකරණසම්පත්තිජනිතනිරවජ්ජවචනෙන අරිමද්දන පුරවාසිනා අග්ගවංසාචරියෙන කතං සද්දනීතිපකරණං නිට්ඨිතං'' යනුවෙන් කර්තෘවරයාගේ තොරතුරු අන්තර්ගත කොට තිබේ. රචිත කාලය වන්නේ ක්‍රි:ව: 1154 දිය. මහාපරාක්‍රම රාජ සමය හෙවත් පොළොන්නරු යුගයේ දී මෙම සද්දනීති ව්‍යාකරණය ලංකාවට ගෙනවිත් තිබේ. වත්මනෙහි දක්නට ලැබෙන මහාසද්දනීතිප්පකරණයට ලියූ සන්න දක්නට නොමැත. 1909 අරුග්ගොඩ සීලානන්ද හිමියන්ගේ සංස්කරණය පෙළ පමණක් වෙයි. අප ද මේ කාර්යයන් සඳහා භාවිත කරන ලද්දේ එකී සංස්කරණය වෙයි)
3. එම, පි. 08
4. එම, පි. 20

   "පච්චුපන්නස්මිං කාලස්මිං වත්තමානා පවත්තති,
   ආස්ට්ඨා'ණපනත්ථෙසු පච්චුපන්නම්හි පඤ්චමී.

   පච්චුපන්නේන පරිකප්පා'නුමත්‍ය'ත්ථෙසු සත්තමී,
   අපච්චක්ඛෙ අතීතම්හි පරොක්ඛා සම්පවත්තති.

   හියොප්පභුති කාලස්මිං අතීතම්හි පවත්ති,
   පච්චක්ඛෙ වා අපච්චක්ඛෙ හීයත්තනී නිරුත්තති.

   අජ්ජප්පභුති කාලස්මිං අතීතම්හි පවත්තති,
   පච්චක්ඛෙ වා අපච්චක්ඛෙ සමීජ'ජ්ජතනව්හයා.

   අනාගතේ භවිස්සන්ති කාලස්සමිං සම්පවත්තති,
   ක්‍රියා'තිපන්නමත්තම්හි'තීතේ කාලාතිපත්තිකා;
   අනාගතේ'පි හෝතී'ති නිරුත්තඤ්'හි භාසිතා.
5. එම, පි. 230
6. එම, පි. 246
7. එම, පි. 264
8. කච්චායන ධාතු මඤ්ජුසා. සංස්: ඉඳුරාගාරේ ධම්මරතන හිමි. පි. 07
9. පාලි සිංහල ශබ්දකෝෂය, පි. 182. උප+ඉ+පාපනෙ, පැමිණීමෙහි+ණෙ+ති, පැමිණෙයි.
10. මහාසද්දනීතිප්පකරණ, පි. 503
11. එම, පි. 504

    භූවාදිතො අකාරො ච සානුසාරො රුධාදිතො,
    අකාරො චෙ'වි'වණ්ණො'ච'එකාරො'කාරමෙ'වච.

    සප්පච්චයො දිවාදිම්හා'ණුණඋණ'ච ස්වදිතො,
    කියාදිතො පන නා'යෙව'ප්පණ්හා'පන ගහාදිතො.

    ඔයිරා'තු තණදිම්හා ණෙණයා'ච චුරාදිතො,
    අගහිතගහණෙන පච්චයා දසපච්චඤ්ච

12. මහාසද්දනීතිප්පකරණ, පි. 531. යත්ථ යස්මා සන්ධි කිච්චං නාමා ලොණධූපනං විය සබ්බබ්‍යඤ්ජනෙසු, සබ්බකම්මික අමච්චො විය සබ්බරාජකිච්චෙසු සබ්බත්ථ ඉච්චිතං හොති.

13. සිංහල පාලි ශබ්දකෝෂය, පි. 19

14. මහාසද්දනීතිප්පකරණ, පි. 538. සන්ධීයන්ති එත්ථ පදානි අක්ඛරානිවා'ති සන්ධි. සංහිතා පදං. සරාණං සරෙසු වා සන්ධි සරසන්ධි එත්ථ ච සරා'දෙසලොපකරණවසෙන සාධිතො සන්ධි සරසන්ධි වුච්චති

15. එම, පි. 552. මිස්සිභූතානං සරබ්‍යඤ්ජනා'දීනං සන්ධි වොමිස්සක සන්ධි තථාහි
සරබ්‍යඤ්ජනනිග්ගහීතා'දෙසලොපකරණවසෙන සාධිතො සන්ධි වොමිස්සකසන්ධී'ති වුච්චති

16. එම, පි. 648

17. එම, පි. 682

18. එම, පි. 707

19. එම, පි. 707. වත්තමානා'දීනං විභත්තීනං යානි යානි පුබ්බාකාර ඡ පදානි? තානි තානි පරස්සපදානි නාම. ති අන්ති සි ථ මි ම

20. එම, පි. 771. තත්ථ නාමිකපදං ආඛ්‍යාතපදං උපසග්ගපදං නිපාතපදන්ති චත්තාරි වාචෝගධපදානි නාම හොන්ති